ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව- **06** වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය **02- 2022/2023**

**LLU 6717-** අන්තර්ජාතික මානව හිමිකම් නීතිය

කාලය- පැය එක **(01)** යි.

---

දිනය: **03.12.2023** වේලාව: පෙ.ව. **09.30**- පෙ.ව.**10.30**

---

මුළු ප්‍රශ්න ගණන - **02**

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01.පහත ප්‍රවෘත්ති වාර්තාව කියවා යටින් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජනසංහාරය පිළිබඳ චෝදනා පිළිබඳව ඊශ්‍රායලයට එරෙහිව විමර්ශන කටයුතු කරන ලෙසට පලස්තීනුවන් ඉල්ලා සිටී.

හේග් නුවර, නොවැම්බර් 10 (රොයිටර්ස්) - ගාසා තීරයට බෝම්බ හෙලීම හා වටලෑම තුලින් ජනසංහාරය ඇතුලු යුද අපරාධ සිදුකිරීම සම්බන්ධව ඊශ්‍රායලය වෙත චෝදනා කරන පලස්තීන ජාතික මානව හිමිකම් සංවිධාන තුනක් මේ පිළිබඳ විමර්ශනය කරන ලෙසට අන්තර්ජාතික අපරාධ අධිකරණයෙන් ඉල්ලා තිබෙන බවට ප්‍රකාශ කරයි.

ඊශ්‍රායලය හේග් නුවර පිහිටි අධිකරණයේ සාමාජිකයෙක් නොවන අතර, එහි අධිකරණ බලය පිළි නොගනී. ජනසංහාරය පිළිබඳ චෝදනා පදනම් විරහිත බවත්, තමුන් ගාසා තීරය පාලනය කරන හමාස් සංවිධානයේ සටන්කාමීන් ඉලක්ක කරනු විනා සිවිල් වැසියන් ඉලක්ක නොකරන බවටත් ඊශ්‍රායලය මීට පෙර ප්‍රකාශ කොට තිබුණි.

මේ පිළිබඳ කරුණු විමසූ විට, ඊශ්‍රායලයේ විදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රකාශකයෙක් මෙසේ සඳහන් කලේය : 'ඔක්තොම්බර් 7 වන දා ඊශ්‍රායලයට එරෙහිව හමාස් සංවිධානය කල ආක්‍රමණය නිසා සහ ඉන්පසුව ගාසාහි දී සිවිල් වැසියන් මිනිස් පලිහක් ලෙස යොදාගැනීම තුල සිදුවූ මනුෂ්‍යාත්වයට එරෙහි අපරාධ සහ යුද අපරාධ ඊශ්‍රායලය තොරතුරු එකතු කරමින් සිටී."

(අ) 'අන්තර්ජාතික අපරාධ' යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

(ආ) ඊශ්‍රායල ආණ්ඩුව හා හමාස් සංවිධානයට එරෙහි චෝදනා අන්තර්ජාතික අපරාධ අධිකරණය වෙත යොමු කල හැකිදැ'යි විමසන්න. අන්තර්ජාතික නීතියේ පූර්ව නිදර්ශන ආශ්‍රයෙන් ඔබගේ පිළිතුර සනාථ කල යුතුය. (ලකුණු 15)

(05+15=ලකුණු 20)

02. මානව හිමිකම් විශ්ව ප්‍රකාශනයේ 75 වන සංවත්සරය 2023 දෙසැම්බර් මස අනුස්මරණය කෙරෙයි. මෙම ප්‍රකාශනය ආරම්භයේ දී සම්මත වූයේ නීතිමය බැඳීමක් නොමැති ලියැවිල්ලක් ලෙසටය. කෙසේ වුවද, ඇතැම් විචේචකයන් පෙන්වා දෙන්නේ, මෙම ප්‍රකාශනයේ ඇතුලත් නියාමයන් අද වන විට අන්තර්ජාතික නීතියේ බන්ධනාත්මක නියාමයන් බවට පරිවර්තනය වී ඇති බවයි.

සුදුසු උදාහරණ ඇසුරින් උක්ත ප්‍රකාශය විචේචනාත්මකව අගයන්න. (ලකුණු 20)

**-හිමිකම් ඇවිරිණි-**